රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2021.05.01

නිවේදන අංකය: 409/2021
නිකුත් කළ වේලාව:17:30

අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති)
ප්‍රවෘත්ති කර්තෘ

**2021 මැයි 01 සිට ක්‍රියාත්මක කොවිඩ් මර්දන මාර්ගෝපදේශ**

කොවිඩ් ව්‍යාප්තිය මර්දනය කිරීම පිණිස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශිත Alert Level 3 (සෝදිසි අවධි - 3 ) මාර්ගෝපදේශ අනුව 2021 මැයි 01 දින සිට පහත සඳහන් නියමයන් බලපවත්වන බව කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය නිවේදනය කරයි.

01. සමුළු (Conference)/ සම්මන්ත්‍රණ (Seminars)/ රැස්වීම් (Meetings)/ සන්නාම දිවා භෝජන (Brand Lunches) 2021.05.21 දක්වා තහනම්. ඉන් පසුව පවතින කොවිඩ් තත්ත්වයට අනුරූපව නැවත සමාලෝචනය කරනු ලැබේ.

02. සුපිරි වෙළෙඳසැල් (Super Market), මහාපරිමාණ අලෙවිහල් (Shoppers Malls), මූල්‍ය ආයතන, රෙදිපිළි වෙළෙඳ සැල්, සිල්ලර වෙළෙඳ සැල් ක්‍රියාත්මක විය යුත්තේ මුළු පාරිභෝගික ධාරිතාවෙන් 25% ක සීමාවට යටත්වය.

03. සංවෘත ස්ථානවල සහ විවෘත ස්ථානවල පවත්වන සාද අංග (Events) සහ මහජන එක්රැස් වීම් සඳහා අවසර නැත.

04. ආගමික ස්ථානවල ජනතාව එක්රැස් වීම නොකළ යුතුය.

05. සිනමා ශාලා සහ රංග ශාලා, ළමා උද්‍යාන, පිහිනුම් තටාක, Pub සහ Bars, Casino සහ රාත්‍රී සමාජ ශාලා, ඔට්ටු ස්ථාන (Betting Centers) සහ සම්භාහන ස්ථාන වසා තැබේ. .

06. හෝටල්, තානායම් හා ආගන්තුක නිවාස (Guest Houses) ආදියෙහි රඳවා තබා ගත හැකි සංඛ්‍යාව මුළු ධාරිතාවෙන් 50%ක් වන අතර රාත්‍රී 10.00 පසුව ක්‍රියාත්මක නොකළ යුතුය.

07. කානිවල්, සංගීත සංදර්ශන, වෙරළතීර සාද/ උත්සව සඳහා අවසර නැත.

08. විවෘත වෙළෙඳසැල්, පොළ සහ බේකරි වෙළෙඳසැල් ක්‍රියාත්මක විය යුත්තේ මුළු පාරිභෝගික ධාරිතාවයෙන් 25% යටත්වය.

09. උසාවි - මුළු ධාරිතාවයෙන් 25% දක්වා ජනතාවට පැමිණීමට අවසර ඇත.

10. බන්ධනාගාර රැඳවියන් බැලීමට අවසර නැත.

11. පාසල්, පෙර පාසල්, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන, ආධාරක (Tuition) පංති නැවත දැනුම්දෙන තුරු වසා තැබේ.

12. 2021 මැයි 04 දින සිට මැයි 20 දක්වා මංගල උත්සව සඳහා අවසර නොලැබේ. මැයි මස 20 දිනට පසු පවතින කොවිඩ් තත්ත්වයට අනුරූපව නැවත සමාලෝචනය කෙරේ.

**මොහාන් සමරනායක**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை அவெனியூ, கொழும்பு 05, இலங்கை.
(+94 11) 2515759
(+94 11) 2514753
www.news.lk